| නිමැවුම් / සේවා | නිමැවුම් හා සේවා විස්තර | ගනුදෙනුකරුවන්ට ලැබෙන මූල්‍යමය හා වෙනත් ප්‍රතිලාභ අනුකූල පොලිය ආදිය | ගනුදෙනුකරුවන්ගෙන් අයකෙරෙන ගාස්තු / අයකිරීම් / කොමිස් මුදල් / පොලිය ආදිය | නිමැවුම් හා සේවාවන් ලබා ගැනීමට අනුගමනය කල යුතු ක්‍රමවේද | ප්‍රධාන කොන්දේසි හා නියමයන් |
|---|---|---|---|---|---|
| ස්ථාවර තැන්පතු | ස්ථාවර තැන්පතු තනි/බද්ධ ගිණුම් ලෙසද / විශේෂ අරමුදල් හෝ සමාජ සංවිධාන වෙනුවෙන් විවෘත කළ හැකිය.<br><br>වයස අවුරුදු 16 වැඩි ශී ල ප්‍රවාසියෙකුට ජ.ඉ.බැ. වේ ස්ථාවර තැන්පතු ගිණුමක් ආරම්භ කළ හැකි අතර වයස අවු.16 අඩු අයට තම දෙමාපියන් / භාරකරුවන් සමඟ ආරම්භ කළ හැකිය.<br><br>ගිණුම් හිමියන්ට වාර්ෂිකව, අර්ධ වාර්ෂිකව හෝ මාසිකව පොලිය උපයාගත හැකි ආකාරයට මාස 3,6,12,24 ආදී වශයෙන් ස්ථාවර තැන්පතු ගිණුම් ආරම්භ කළ හැකිය. | ගිණුම් කල්පිරීමේ කාලය මත අදාල ස්ථාවර තැන්පතුවේ පොලිය කල් පිරීමේදී අදාල ණය ගිණුමට බැර කෙරුණු නම් ස්ථාවර ගිණුමක් 90% ක් ණය වශයෙන් ලබා ගත හැකිය.<br><br>ස්ථාවර ගිණුම මත 90% ක වක්‍රීය ණය පහසුකම් ලැබෙන අතර, එන්.එස්.බී රිසි කාඩ් පත්වල (වීසා සහ මාස්ටර් කාඩ් සහිතව) ලබා ගත හැකිය.<br><br>වාර්ෂිකව පොලී උපයන ස්ථාවර තැන්පතු සඳහා වන ගිණුමක් විවෘත කිරීමේ අවම තැන්පතුව රුපියල් 1,000/- වන අතර මාසිකව පොලිය උපයන ස්ථාවර තැන්පතු ගිණුමක් සඳහා වන අවම තැන්පතුව රු. 25,000/- | කරුණාකර අයකිරීමේ සහ සේවා ගාස්තු අඩංගු සටහන බලන්න. | මැන්ඩේට් පත්‍රය - තනි පුද්ගල සහ බද්ධ ඇතුළුව බාලවයස්කරුවන් වෙනුවෙන් පෝරම FD/03 / හඳුනාගැනීමේ ලේඛන (ජාතික හැඳුනුම්පත / විදේශ ගමන් බලපත්‍රය / රියදුරු බලපත්‍ර ජායා පිටපතක් සමඟ අත්‍යාවශ්‍ය KYC පත්‍රිකාව මුදල් තැන්පතු පත්‍රිකාව)<br><br>ලිපින තහවුරුව - ලිපිනය, ජා.හැ.ප / වලංගු විදේශ ගමන් බලපත්‍රය / රියදුරු බලපත්‍ර ආදියෙන් වෙනස් වන්නේ නම් - පළාත් පාලන ආයතනයකින් ලබාගත් ලිපියක් / ආදායම් බදු ලදුපතක් / රැකියා ගිවිසුමක් / වෙනත් බැංකු ප්‍රකාශ / කුලී ගිවිසුම් / ග්‍රාම නිළධාරී සහතිකය / උපයෝගිතා බිල්පත් (ජල,විදුලි,ස්ථාවර දුරකථන බිල්පත් ඒවා නිකුත් කර මාස 03 කට වඩා පැරණි නොවිය යුතුය.)<br><br>වෙනත් මාදිලියේ තැන්පතු සඳහා (ව්‍යාපාර / ක්‍රීඩා සමාජ / සමිති සමාගම් / අධිකරණ සංවිධාන) ආදිය සඳහා රඳවා ගැනීමේ බදු ප්‍රකාශන පත්‍රිකාව | කල් පිරීමේදී ස්ථාවර පොලී අනුපාතිකයක් හෝ පොලිය මාසිකව ගෙවීමේ පදනම මත වලංගු වන අතර තැන්පතුව සිදුකළ දින සිට මාසය සම්පූර්ණ වන දිනට පොලිය ගණනය කළ යුතුය. කල්පිරීමේදී අවශ්‍ය නම් තැන්පතු පොලිය ලබාගත හැකි අතර, එසේ නොවේනම් මුල් මුදලට එකතුවීමට හෝ වෙන් කළ පාර්ශවයකට බැර කළ හැකිය.<br><br>අදාල වන කාල සීමාව අවම සහ උපරිම මුදල හා පොලී ප්‍රතිශතය ආදිය පවතින නියාමනයන් වෙළඳ පළේ පවතින පොලී අගය ආදිය පදනම් කරගෙන කළමනාකාරීත්වය විසින් තීරණය කරනු ඇත.<br><br>ස්ථාවර තැන්පතු සඳහා පොලී ප්‍රතිශතය තැන්පතුව සිදුකෙරෙන දින වෙළඳපළේ පවතින ප්‍රතිශතය මත ප්‍රකාශ කෙරේ.<br><br>ගනුදෙනුකරුවකුට ස්ථාවර තැන්පතු සහතිකයක් නැවත අලුත් කරවා ගැනීමට හෝ වෙනස් කරවා ගැනීමක් හෝ මුදල් ආපසු ගැනීමක් ආදල කල් පිරීමේ දිනට සිදු කරගත නොහැකි වුවහොත්<br><br>මාස 36 සිට 60 දක්වා වූ ඒ ත්‍රිත්වයේ තැන්පතුවක් මාස 01ක් සම්පූර්ණ වීමට ප්‍රථම, මාස 03ක ස්ථාවර තැන්පතුවක් මාස 01ක් සම්පූර්ණ වීමට ප්‍රථම ආපසු ගැනීමක් සිදු කළහොත් පොලිය ගෙවනු නොලැබේ. |

| නිමැවුම් / සේවා | නිමැවුම් හා සේවා විස්තර | ගනුදෙනුකරුවන්ට ලැබෙන මූල්‍යමය හා වෙනත් ප්‍රතිලාභ අනුකූල පොලිය ආදිය | ගනුදෙනුකරුවන්ගෙන් අයකෙරෙන ගාස්තු / අයකිරීම් / කොමිස් මුදල් / පොලිය ආදිය | නිමැවුම් හා සේවාවන් ලබා ගැනීමට අනුගමනය කල යුතු ක්‍රමවේද | ප්‍රධාන කොන්දේසි හා නියමයන් |
|---|---|---|---|---|---|
| | | | | | කෙසේවෙතත්, මෙම ස්ථාවර තැන්පතුව හිසී කලට අලුත් කළහොත් ඉහත සඳහන් කොන්දේසි බලනොපාන අතර, අලුත් කිරීම ගනුදෙනුකරුගේ ඉල්ලීම මත හෝ ස්වයංක්‍රීයව සිදුවේ.<br><br>කල් පිරීමේදී උපචිත පොලිය ගෙවීමෙන් පසුව තවදුරටත් අදාල තැන්පතුවට පොලිය ගෙවීමට බැංකුව බැඳී නොමැත. ඉහත සඳහන් කොන්දේසි අංක 4 සහ 5 ට යටත්ව ස්ථාවර තැන්පතු සහතිකයක් ගනුදෙනු කළහැකි උපකරණයක් නොවේ.<br><br>ගෞරව සහ විශ්‍රාමික ගිණුම් වලින් තැන්පතු කල් පිරීමට මෙම ගිණුම් වලට සාමාන්‍ය මාස 12 ක් ස්ථාවර තැන්පතු වලට හිමි පොලිය පමණක් හිමිවේ.<br><br>නැවත අලුත් කිරීමේ නිවේදන තෙවන පාර්ශවයකට නිකුත් කරනු නොලැබේ. |

**ගනුදෙනුකරු විසින් අනවසර හෝ වැරදි ගනුදෙනුවක් හඳුනා ගත් විට, එය වහාම ගිණුම නඩත්තු කරන ශාඛාවට හෝ බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය හරහා 0112379379 අංකයට දැනුම් දිය යුතුය.**

**ඕනෑම පැමිණිල්ලක් සඳහා කරුණාකර වැඩ කරන දිනවල පෙ.ව. 8:30 සිට ප.ව. 3:00 දක්වා 0112 576 730 / 0112 377200 (දිගුව 455) අංකයට අමතන්න.**